# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# දැන්වීමයි

## 2024 (2025) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ නැවත සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් වීම මත විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගෙන් 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

2025 අගෝස්තු මස 7 වැනි දින නිකුත් කරන ලද 2024 (2025) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ නැවත සමීක්ෂණ ප්‍රතිඵල මත 2024/2025 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගෙන් **2025 සැප්තැම්බර් මස 3 දින සිට 2025 සැප්තැම්බර් මස 17 වැනි දින දක්වා** අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත් කැඳවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත.

අයදුම්පත් යොමු කිරීම සම්බන්ධ වැඩිදුර විස්තර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි **(www.ugc.ac.lk)** 2024/2025 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ අයදුම්පත් කැඳවීම හා සම්බන්ධව මින් පෙර පළ කරන ලද පුවත්පත් නිවේදනයෙහි දක්වා ඇත.

**වැදගත්**

**පාඨමාලා සඳහා වන කැමැත්තේ අනුපිළිවෙළ වෙනස් කිරීම සඳහා 2025 සැප්තැම්බර් මස 17 වැනි දින සිට 2025 සැප්තැම්බර් මස 23 වැනි දින දක්වා සතියක කාලයක් ලබා දෙන බව දන්වා සිටිමි.**

**තව ද, ඉහත සඳහන් කර ඇති අයුරින් 2024/2025 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් යොමු කිරීමට ලබා දී ඇති අවස්ථාව අදාළ විශ්වවිද්‍යාල/ මණ්ඩපය/ උසස් අධ්‍යාපන ආයතනය මඟින් පවත්වා අවසන් කළ යෝග්‍යතා/ ප්‍රායෝගික පරීක්ෂණ පවතින අධ්‍යයන පාඨමාලා සඳහා අයදුම් කිරීමට අදාළ නොවන බව ද මෙයින් දන්වා සිටිමි.**

සභාපති,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.
2025.09.01